# රජයේ පාසල් ගුරුවරුන්ගේ රැකියා තෘප්තිමත්භාවය සඳහා බලපාන ආර්ථික, සමාජීය, ප්‍රජාවිද්‍යාත්මක සාධක අධ්‍යයනය (ගම්පහ අධ්‍යාපන කොට්ඨාශය ඇසුරෙන්)

එච්.ඒ.සී. සඳුනි හෙට්ටි ආරච්චි[1]

## 1. හැඳින්වීම

මෙම පර්යේෂණය සිදු කිරීමට ප්‍රථම ගුරුවරුන්ගේ රැකියා තෘප්තිය සඳහා බලපාන ආර්ථික සාධක පිළිබඳවත්, සමාජීය සාධක පිළිබඳවත්, ප්‍රජාවිද්‍යාත්මක සාධක පිළිබඳවත් දේශීය, විදේශීය වශයෙන් ඉදිරිපත් වී ඇති අර්ථ නිරූපණ හා පර්යේෂණ පිළිබඳව අධ්‍යයනය කරන ලදී. බොහෝ පර්යේෂකයින් ආර්ථික, සමාජීය හා ප්‍රජාවිද්‍යාත්මක සාධක ගත් කළ ගුරුවරුන්ගේ රැකියා තෘප්තිය සඳහා වැඩි වශයෙන් බලපාන සාධක ලෙස සමාජීය සාධකයන් පිළිබඳව අධ්‍යයනය කිරීම දැක ගත හැකිය. ශ්‍රී ලංකාවේ රජයේ පාසල් ගුරුවරුන්ගේ රැකියා තෘප්තිමත්භාවය සඳහා බලපාන සාධක අධ්‍යයනය කිරීම පිළිබඳව සිදු කර ඇති පර්යේෂණය ඉතා විරල වේ. එසේම ගුරුවරුන්ගේ රැකියා තෘප්තිය සඳහා බලපාන සාධක පිළිබඳව අධ්‍යයනය කළ ද ඒවා පොදුවේ ආර්ථික, සමාජීය හා ප්‍රජාවිද්‍යාත්මක සාධක වශයෙන් කාණ්ඩ කර වෙන වෙනම අධ්‍යයනය කර ඇති මෑත කාලීන පර්යේෂණයන් නොමැත.

වර්තමානයේ පවතින Covid 19 වසංගතය හමුවේ සහ දීර්ඝ කාලයක් තිස්සේ පැන නැගී ගෙන එන විසඳුමක් නොලැබුණු ප්‍රශ්න හේතුවෙන් ගුරුවරුන්ගේ රැකියා තෘප්තිමත්භාවය වර්තමානය වන විට බෙහෙවින් වෙනස් වෙමින් පවතී. ඒ අනුව වර්තමානයට ගැලපෙන පරිදි රජයේ පාසල් ගුරුවරුන්ගේ රැකියා තෘප්තියට බලපාන සාධක කාණ්ඩ වශයෙන් ගෙන ආර්ථික, සමාජීය හා ප්‍රජාවිද්‍යාත්මක සාධක අධ්‍යයනය කිරීමේ අරමුණින් කරනු ලබන මෙම පර්යේෂණය කාලීන අවශ්‍යතාවයක් පූර්ණය කරනු ලබන බව කිව හැකිය.

ගුරුවරයාගේ සුවිශේෂී කාර්යභාරය විවිධ ක්ෂේත්‍ර ඔස්සේ ඉස්මතු කිරීමට උත්සාහ දැරීම නිසා ගුරු භූමිකාව වඩාත් පුළුල් අර්ථයෙන් විග්‍රහ කිරීමට හැකි වී ඇත. ගුරුවරුන් යනු දැනුමේ ප්‍රධාන පහසුකම් සපයන පුද්ගලයින් වන අතර ජාතියක් ගොඩනැගීමේදී එය වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. එබැවින් ගුරුවරුන්ගේ සේවා ස්ථාන වල සුවපහසුව ගැන සොයා බැලීම, පහසුකම් සැලසීම ඉතා වැදගත් වේ. ගුරුවරුන් තෘප්තිමත් වූ විට දැනුම, කුසලතා වර්ධනය වී ජාතියේ දියුණුව හා සාර්ථකත්වය සාක්ෂාත් කර ගැනීම සඳහා තම යුතුකම් වඩාත් ඵලදායීව ඉටු කළ හැකිය (Van den Berg, 2002; Scott, Stone) Dinham, 2001).

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය
sandunihettiarachchi99@gmail.com

ගුරුවරයා තම වෘත්තිය පිළිබඳව සෑහීමකට පත් වීම සිසුන්ගේ ඉගෙනීමට ප්‍රබල බලපෑමක් ඇති කළ හැකිය. සමහර පර්යේෂකයින් තර්ක කරන්නේ තම කාර්යයට සහයෝගය නොදක්වන ගුරුවරුන් පන්ති කාමරයේ උපරිමයෙන් කටයුතු කිරීමට පෙළඹීමක් නොමැති බවයි. ඊට අමතරව, ඉහළ තෘප්තිමත්භාවයක් ඇති ගුරුවරුන් තම සේවා ජීවිතයේ බොහෝ අංශ පිළිබඳව සෑහීමකට පත් නොවන අයට වඩා පාසල් වෙනස් කිරීමට හෝ ගුරු වෘත්තියෙන් ඉවත් වීමට ඇති ඉඩකඩ අඩු බවය. ගුරුවරයෙකුගේ තෘප්තිමත්භාවයට බලපාන සාධක අතරට සහජ සාධක, බාහිර සාධක හා ජන විකාශන සාධක සහ ගුරුවරුයාගේ සහ පාසලේ තනි ලක්ෂණ ඇතුළත් වේ (Choy et al., 1993).

ශ්‍රී ලංකාවේ රජයේ පාසල්වල ගුරුවරුන්ගේ රැකියා තෘප්තිමත්භාවයට බලපාන ප්‍රධාන සාධක මොනවාද? යන්න මෙම අධ්‍යයනයේ ගැටලුව වේ. මෙම ගැටලුව මත පදනම්ව ගුරුවරුන්ගේ රැකියා තෘප්තිමත්භාවයට බලපාන ප්‍රධාන සාධක අධ්‍යයනය කිරීම මෙහි මූලික අරමුණු වේ. උප අරමුණු වශයෙන් ගුරුවරුන්ගේ රැකියා තෘප්තිමත්භාවයට බලපාන ආර්ථික සාධක අධ්‍යයනය කිරීම ,ගුරුවරුන්ගේ රැකියා තෘප්තිමත්භාවයට බලපාන සමාජීය සාධක අධ්‍යයනය කිරීම ,ගුරුවරුන්ගේ රැකියා තෘප්තිමත්භාවයට බලපාන ප්‍රජාවිද්‍යාත්මක සාධක අධ්‍යයනය කිරීම සිදු කරයි. මෙම පර්යේෂණයේ ප්‍රතිඵල මඟින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු වර්තමානයේ ජාතික තලය ඉතා වැදගත් වේ. එනම්, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කටයුතුවලට මෙන්ම අධ්‍යාපන ක්ෂේත්‍රයේ බොහෝ අංශ සඳහා මෙම අධ්‍යයනය ඉතා වැදගත් වේ. මෙම පර්යේෂණ සිදු කිරීමේදී වර්තමාන Covid 19 වසංගත තත්ත්වය හමුවේ අධ්‍යයන ප්‍රදේශ සඳහා යාමට නොහැකි විය. එහිදී එම සීමා වලට අනුකූලව කටයුතු කරන ලදී.

## 2. අධ්‍යයන ක්‍රමවේදය

2020 වාර්ෂික පාසල් සංගණන වාර්තාවට අනුව ශ්‍රී ලංකාව තුළ පළාත් අනුව රජයේ පාසල් ගුරුවරුන් පිළිබඳව විමසීමේදී ප්‍රමුඛස්ථානය හිමි කර ගන්නා බස්නාහිර පළාතේ ප්‍රධාන දිස්ත්‍රික්කයක් වන ගම්පහ දිස්ත්‍රික්කයේ අධ්‍යාපන කලාපය 4 තුළ ඇති අධ්‍යාපන කොට්ඨාශ 13න් වැඩිම ගුරුවරුන් පිරිසක් සිටින ගම්පහ අධ්‍යාපන කොට්ඨාශය තෝරා ගෙන මෙම අධ්‍යයනය සිදු කරන ලදී.

මෙම අධ්‍යයනයේදී සංගහන ප්‍රමාණය දන්නා හෙයින් නියැදිය තේරීම සඳහා යමානී (Yamane) ක්‍රමවේදය භාවිතා කරන ලදී. ඒ අනුව ගම්පහ අධ්‍යාපන කොට්ඨාශයෙහි මුළු ගුරුවරු සංඛ්‍යාව 2028 ක් වූ සංගහනයෙන් 95%ක විශ්වාසයකින් යුතුව ගුරුවරුන් 334ක නියැදියක් බහුපිය පොකුරු නියැදුම් ක්‍රමය යටතේ තෝරා ගෙන ප්‍රශ්නාවලි ක්‍රමය, සම්මුඛ සාකච්ඡා ක්‍රමය යොදා ගනිමින් දත්ත රැස් කිරීම සිදු කරන ලදී. මෙම පර්යේෂණයෙහි ද්විතියික දත්ත ලබා ගැනීම සඳහා අධ්‍යාපන අමාත්‍යංශ වාර්ෂික කාර්යසාධන

වාර්තාව, ශ්‍රී ලංකා ගුරු සේවයේ ව්‍යවස්ථාව, පාසල් සංගණන වාර්තාව, ගම්පහ අධ්‍යාපන කාර්යාල වාර්තාව, වෙබ් අඩවි ආදී ද්විතියික දත්ත භාවිතා කර ඇත.

රැස් කරනු ලැබූ ප්‍රාථමික දත්ත යොදා ගනිමින් එම දත්ත විස්තරාත්මක සංඛ්‍යාන ක්‍රම, කයි-වර්ග පරීක්ෂාව, සහසම්බන්ධතා සංගුණකය, සහ සාධක විශ්ලේෂණය ආදී ක්‍රමවේදයන් ඔස්සේ විශ්ලේෂණය කර ඇත. මෙම මිනුම් ලබා ගැනීම සඳහා SPSS (Statistical Package for Social Science) මෘදුකාංගය භාවිතා කර ඇත. ගුරුවරුන්ගේ තෘප්තිමත්භාවය මැනීම සඳහා කරුණු 5ක ලිකර්ට් පරිමාණය (Likert Scale) සහිත ප්‍රශ්නාවලියක් නම් ක්‍රමවේදය භාවිතා කර තිබේ. එසේම EXCEL පරිගණක මෘදුකාංගය ආශ්‍රයෙන් සකස් කරන ලද වගු, ප්‍රස්ථාර දත්ත විශ්ලේෂණය සඳහා භාවිතා කර ඇත.

### 3. ප්‍රතිඵල සහ සාකච්ඡාව

රජයේ පාසල් ගුරුවරුන්ගේ රැකියා තෘප්තිමත්භාවය සඳහා බලපාන සාධක හඳුනා ගැනීමට භාවිතා කරන ලද ප්‍රශ්නාවලියේ වලංගුභාවය හා විශ්වාසනීයත්වය පරික්ෂා කිරීම සඳහා වලංගුභාවය හා විශ්වාසනීයත්වය පිළිබඳ පරික්ෂා කරන ලදී.

වගු අංක 1: Cronbach ඇල්ෆා හි පරීක්ෂණ

| කාණ්ඩය | ඇල්ෆා අගය |
|---|---|
| ආර්ථික සාධක | 0.849 |
| සමාජීය සාධක | 0.795 |

*මූලාශ්‍රය: SPSS Output, 2022*

වගු අංක 1 හි දැක්වෙන ඇල්ෆා අගයන් අනුව රජයේ පාසල් ගුරුවරුන්ගේ රැකියා තෘප්තිමත්භාවය සඳහා බලපාන ආර්ථික, සමාජීය සාධක සම්බන්ධයෙන් අසන ලද ප්‍රශ්න සඳහා ලැබුණු Cronbach හි ඇල්ෆා අගය 0.7 ට වැඩි වූ අතර එබැවින් එම ප්‍රශ්න තුළ සංගත බවක් ඇත යන්න තහවුරු විය. එබැවින් එම දත්ත විශ්ලේෂණය සඳහා යොදා ගැනීමට සුදුසු විය.

කයිවර්ග පරීක්ෂාව හා සහසම්බන්ධතා විශ්ලේෂණය මඟින් මෙම පරීක්ෂණයේ උපකල්පන පරික්ෂා කරන ලදී.

වගු අංක 2: කල්පිත පරීක්ෂාව - කයිවර්ග පරික්ෂාව හා සහසම්බන්ධතා විශ්ලේෂණය

| කාණ්ඩ | ස්වායත්ත විචල්‍යය | R අගය (ස්පියර් මන්) | Sig. අගය (කයිවර්ග පරීක්ෂාව ) | $H_0$ පිළිගැනීම/ ප්‍රතික්ෂේප කිරීම |
|---|---|---|---|---|
| ආර්ථික සාධක | වැටුප | 0.520 | 0.000 | පිළිගනී |
| | වැටුප් ශ්‍රේණිය | 0.348 | 0.000 | පිළිගනී |
| | සේවක ණය | 0.264 | 0.000 | පිළිගනී |
| | වැටුප් රහිත විදේශීය නිවාඩු | 0.261 | 0.002 | පිළිගනී |
| | මූල්‍ය ප්‍රතිලාභ | 0.275 | 0.000 | පිළිගනී |
| | රක්ෂණ ප්‍රතිලාභ | 0.210 | 0.000 | පිළිගනී |
| | විශ්‍රාම වැටුප් | 0.226 | 0.000 | පිළිගනී |
| සමාජීය සාධක | රැකියාවේ නියුතු පාසල් වර්ගය | 0.063 | 0.011 | පිළිගනී |
| | ගුරු වෘත්තිය තුළ සේවා කාලය | 0.098 | 0.002 | පිළිගනී |
| | දැනට සේවය කරන පාසලේ සේවා කාලය | 0.167 | 0.001 | පිළිගනී |
| | උගන්වන විෂය | 0.132 | 0.079 | ප්‍රතික්ෂේප වේ |
| | කාර්යය මණ්ඩලයේ හැසිරීම | 0.133 | 0.061 | ප්‍රතික්ෂේප වේ |
| | ගුරු සේවා කොන්දේසි | 0.062 | 0.727 | ප්‍රතික්ෂේප වේ |
| | නිවසේ සිට පාසලට ඇති දුර | -0.061 | 0.028 | පිළිගනී |
| | නිවසේ සිට පාසලට පැමිණෙන ප්‍රවාහන මාධ්‍යය | -0.010 | 0.615 | ප්‍රතික්ෂේප වේ |
| | ගුරු වෘත්තීය නිපුණතා සංවර්ධනය | 0.122 | 0.016 | පිළිගනී |
| | රැකියා අවස්ථා | -0.067 | 0.000 | පිළිගනී |
| | පිළිගැනීම් | 0.171 | 0.010 | පිළිගනී |
| | උසස්වීම් | 0.110 | 0.479 | ප්‍රතික්ෂේප වේ |
| | පාසලට පැමිණෙන අධීක්ෂකවරු | 0.101 | 0.022 | පිළිගනී |
| | විදුහල්පති නායකත්වය | 0.206 | 0.003 | පිළිගනී |
| | පන්තිකාමර තුළ පවතින පහසුකම් | -0.016 | 0.028 | පිළිගනී |
| | සනීපාරක්ෂක පහසුකම් | 0.076 | 0.028 | පිළිගනී |
| | සිසුන්ගේ හැසිරීම | 0.060 | 0.011 | පිළිගනී |
| | විශ්‍රාම යන වයස | 0.125 | 0.007 | පිළිගනී |
| | රජය විසින් දැනුම ලබා ගැනීමට සුදුසු පරිසරයක් නිර්මාණය කර තිබීම | -0.071 | 0.130 | ප්‍රතික්ෂේප වේ |

| | | | | |
|---|---|---|---|---|
| | කළමනාකරණය හා සංවර්ධන ක්‍රියාමාර්ග වල ප්‍රයෝජනවත්භාවය | 0.209 | 0.000 | පිළිගනී |
| ප්‍රජාවිද්‍යාත්මක සාධක | ස්ත්‍රී පුරුෂ භාවය | 0.277 | 0.000 | පිළිගනී |
| | වයස | 0.806 | 0.000 | පිළිගනී |
| | විවාහක අවිවාහක බව | -0.284 | 0.000 | පිළිගනී |
| | දරුවන් සිටීම හා නොසිටීම | 0.452 | 0.000 | පිළිගනී |
| | අධ්‍යාපන මට්ටම | 0.493 | 0.000 | පිළිගනී |

*මූලාශ්‍රය: SPSS Output, 2022*

කයිවර්ග පරීක්ෂාව මඟින් සමාජීය සාධක වල ඇති උගන්වන විෂය, කාර්යය මණ්ඩලය, ගුරු සේවා කොන්දේසි, නිවසේ සිට පාසලට පැමිණෙන ප්‍රවාහන මාධ්‍යය, ගුරුවෘත්තිය තුළ ඇති ශ්‍රේණි උසස් වීම් හා රජය විසින් දැනුම ලබා ගැනීමට සුදුසු පරිසරයක් නිර්මාණය කර තිබීම යන සාධක හැර අනෙකුත් සියලුම ශුන්‍ය කල්පිත (ස්වාධීන විචල්‍යයන් සහ ගුරුවරුන්ගේ රැකියා තෘප්තිමත්භාවය අතර සැලකිය යුතු සම්බන්ධයක් නොමැත) ප්‍රතික්ෂේප කරන ලදී. එබැවින් ගුරුවරුන්ගේ රැකියා තෘප්තිමත්භාවය සඳහා ආර්ථික, සමාජීය හා ප්‍රජාවිද්‍යාත්මක සාධක අතර සැලකිය යුතු සම්බන්ධතාවයක් පවතී.


රජයේ පාසල් ගුරුවරුන්ගේ රැකියා තෘප්තිමත්භාවය හඳුනා ගැනීම සඳහා පටිපාටිගත ලඝු ප්‍රතිපායන විශ්ලේෂණය (Ordinal Logistic Regression) සිදු කරන ලදී.

වගු අංක 3 : පටිපාටිගත ලඝු ප්‍රතිපායන විශ්ලේෂණය

| අංකය | විචල්‍යයේ නම | ඇස්තමේන්තු අගය | Sig. අගය |
|---|---|---|---|
| 1 | ආර්ථික සාධක | 1.150 | 0.000 |
| 2 | සමාජීය සාධක | 1.298 | 0.000 |
| 3 | ප්‍රජාවිද්‍යාත්මක සාධක | -0.024 | 0.930 |

*මූලාශ්‍රය: SPSS Output, 2022*

ඉහත වගු අංක 3 ට අනුව ආර්ථික සාධක එක ඒකකයකින් ඉහළ යන විට රජයේ පාසල් ගුරුවරුන්ගේ රැකියා තෘප්තිමත්භාවයෙහි ලඝු හවුමාව ඒකක 1.150කින් ඉහළ යයි. තවද සමාජීය සාධක ඒකකයකින් ඉහළ යන විට රජයේ පාසල් ගුරුවරුන්ගේ රැකියා තෘප්තිමත්භාවයෙහි ලඝු හවුමාව ඒකක 1.298කින් ඉහළ යයි. එමෙන්ම ප්‍රජාවිද්‍යාත්මක සාධක ඒකකයකින් ඉහළ යන විට රජයේ පාසල් ගුරුවරුන්ගේ රැකියා තෘප්තිමත්භාවයෙහි ලඝු හවුමාව ඒකක 0.024කින් පහළ යයි.




*රූපසටහන 1 :  අයිගන් අගයන් හා සාධක අගයන්*

*මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත, 2022*

ඉහත දැක්වෙන රූපසටහන අනුව ප්‍රධාන සංරචකයන් ගණන ගණනය කිරීමට හැකියාව පවතී. ඒ අනුව 0 ට ආසන්න ලක්ෂයේ පවතින ප්‍රධාන සංරචක ප්‍රමාණය අධ්‍යයනයට යොදා ගනී. මෙම අධ්‍යයනය තුළදී මෙම රූපසටහන අනුව ප්‍රධාන සංරචක 8ක් යැයි තීරණය කළ හැකිය.

රජයේ පාසල් ගුරුවරුන්ගේ රැකියා තෘප්තිමත්භාවය හඳුනා ගැනීම සඳහා සාධක විශ්ලේෂණය සිදු කරන ලදී. එහිදී ගුරුවරුන්ගේ රැකියා තෘප්තිමත්භාවයට බලපාන ආර්ථික හා සමාජීය සාධක 27 ක් මත ප්‍රමුඛ සංරචක විශ්ලේෂණයක් )Principal Component analysis) සිදු කරන ලදී. Kaiser-Meyer-Olkin (KMO)ගේ නියැදීමේ ප්‍රමාණවත් බව මැනමේ මිනුම මඟින් විශ්ලේෂණය කෙරෙහි නියැදීමේ ප්‍රමාණවත් බව තහවුරු කරනු ලබයි. මෙම අධ්‍යයනයට අනුව KMO අගය 0.779 කි. එය ඉතා හොඳ ප්‍රමාණවත් බවකි. ඒ අනුව සාධක විශ්ලේෂණය සඳහා අවශ්‍ය ප්‍රමාණවත් තරම් නියැදි තරමක් ඇති බව දැක්විය හැකිය. Bartlett's ගෝලීය පරීක්ෂාව $X^2 = (351) = 2958.093$, $p < 0.05$, මඟින් ප්‍රමුඛ සංරචක විශ්ලේෂණය (df = 351) සඳහා අයිතම අතර සහසම්බන්ධතාවයන් ප්‍රමාණවත් තරම් විශාල බව පෙන්වා දෙනු ලබයි. දත්තවල එක් එක් සංරචක සඳහා අයිගන් අගයන් ලබා ගැනීම සඳහා මූලික විශ්ලේෂණයක් ක්‍රියාත්මක කරන ලද අතර KMO අගය 1 ට වඩා වැඩි වීම මත පදනම්ව පළමු සංරචක අට Common Factors ලෙස ලබා ගන්නා අතර එමඟින් සලකා බලන විචල්‍යය 27හි විචලනයෙන් 64% ක් විස්තර වන බව දැක්විය හැකිය.

වගු අංක 4 : සංරචක නිර්මාණය කිරීම

| | සංරචක | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 |
| රක්ෂණ ප්‍රතිලාභ | .689 | | | | | | | |
| සේවක ණය | .679 | | | | | | | |
| විශ්‍රාම වැටුප් | .676 | | | | | | | |
| මුල්‍ය ප්‍රතිලාභ | .658 | | | | | | | |
| වැටුප් රහිත විදේශීය නිවාඩු | .538 | | | | | | | |
| කළමනාකරණය හා සංවර්ධන ක්‍රියාමාර්ග වල ප්‍රයෝජනවත්භාවය | .488 | | | | | | | |
| උසස්වීම් | | .737 | | | | | | |
| පිළිගැනීම් | | .708 | | | | | | |
| පාසලට පැමිණෙන අධීක්ෂකවරු | | .647 | | | | | | |
| රැකියා අවස්ථා | | .614 | | | | | | |
| සනීපාරක්ෂක පහසුකම් | | | .834 | | | | | |
| පන්තිකාමර තුළ පවතින පහසුකම් | | | .832 | | | | | |
| සිසුන්ගේ හැසිරීම | | | .707 | | | | | |
| රැකියාවේ නියුතු පාසල් වර්ගය | | | | .766 | | | | |
| ගුරු වෘත්තිය තුළ සේවා කාලය | | | | .730 | | | | |
| දැනට සේවය කරන පාසලේ සේවා කාලය | | | | .725 | | | | |
| වැටුප් ශ්‍රේණිය | | | | | .773 | | | |
| වැටුප | | | | | .764 | | | |
| විශ්‍රාම යන වයස | | | | | .372 | | | |
| නිවසේ සිට පාසලට ඇති දුර | | | | | | .804 | | |
| නිවසේ සිට පාසලට පැමිණෙන ප්‍රවාහන මාධ්‍යය | | | | | | .736 | | |
| කාර්යය මණ්ඩලයේ හැසිරීම | | | | | | | .778 | |
| උගන්වන විෂය | | | | | | | .631 | |
| විදුහල්පති නායකත්වය | | | | | | | .558 | |
| රජය විසින් දැනුම ලබා ගැනීමට සුදුසු පරිසරයක් නිර්මාණය කර තිබීම | | | | | | | | .609 |
| ගුරු සේවා කොන්දේසි | | | | | | | | .602 |
| ගුරු වෘත්තීය නිපුණතා සංවර්ධනය | | | | | | | | .513 |

*මුලාශ්‍රය : සමීක්ෂණ දත්ත, 2022*

## 4. නිගමනය

ගුරුවරුන්ගේ රැකියා තෘප්තිමත්භාවයට ප්‍රජාවිද්‍යාත්මක සාධක යම් බලපෑමක් ඇති කරයි. නමුත් එයට නිශ්චිත හේතුවක් කිව නොහැකිය. එයට හේතුව ඔවුන්ගේ ස්ත්‍රී පුරුෂභාවය, වයස, විවාහක අවිවාහක බව, දරුවන් සිටීම හා නොසිටීම හා අධ්‍යාපන මට්ටම විවිධ ප්‍රතිඵල ලබා ගන්නා බැවිනි. රජයේ පාසල් දෙස අවධානය යොමු කිරීමේදී ගුරුවරුන්ට වඩා ගුරුවරියන් වැඩිය. වයස හා ගුරුවරුන්ගේ රැකියා තෘප්තිය අතර ප්‍රබල ධන සහසම්බන්ධතාවයක් හඳුනා ගෙන ඇත. එසේම ස්ත්‍රී පුරුෂභාවය, දරුවන් සිටීම හා නොසිටීම හා අධ්‍යාපන මට්ටම අතර දුබල ධන සහසම්බන්ධතවයක් ද විවාහක අවිවාහක බව අතර දුබල ඍණ සහසම්බන්ධතවයක් ද හඳුනා ගන්න ලදී.

ගුරුවරුන්ගේ රැකියා තෘප්තිමත්භාවයට ආර්ථික සාධක බලපෑමක් ඇති කරයි. අධ්‍යයනය නිගමනය කරන්නේ වැටුප ගුරුවරුන්ගේ රැකියා තෘප්තිමත්භාවය තීරණය කරන ප්‍රබල ධන සහසම්බන්ධතාවයක් සහ අනෙකුත් ස්වාධීන විචල්‍යයන් ගුරුවරුන්ගේ රැකියා තෘප්තිමත්භාවය නිර්ණය කරන සාධක ලෙස හඳුනා ගෙන ඇති නමුත් එහි දුබල ධන සහසම්බන්ධතාවයක් පවතින බවයි.

ගුරුවරුන්ගේ රැකියා තෘප්තිමත්භාවයට සමාජීය සාධක බලපෑමක් ඇති කරයි. පාසල් වර්ගය, ගුරුවෘත්තිය තුළ සේවා කාලය, දැනට සේවය කරන පාසලේ සේවා කාලය, උගන්වන විෂය, කාර්යය මණ්ඩලය, ගුරු සේවා කොන්දේසි, ගුරු වෘත්තීය නිපුණතා සංවර්ධනය, සමාජයේ පවතින පිළිගැනීම, ගුරුවෘත්තිය තුළ ඇති ශ්‍රේණි උසස් වීම්, අධික්ෂකවරු, විදුහල්පති නායකත්වය, සනීපාරක්ෂක පහසුකම්, සිසුන්ගේ හැසිරීම, විශ්‍රාම යන වයස, රජය විසින් දැනුම ලබා ගැනීමට සුදුසු පරිසරයක් නිර්මාණය කර තිබීම හා කළමනාකරණය හා පුහුණු හා සංවර්ධන ක්‍රියාමාර්ගවල ප්‍රයෝජනවත්භාවය ආදී ස්වාධීන විචල්‍යයන් සම්බන්ධයෙන් දුබල ධන සහසම්බන්ධතාවයක් හඳුනා ගෙන ඇත. එමෙන්ම නිවසේ සිට පාසලට ඇති දුර, නිවසේ සිට පාසලට පැමිණෙන ප්‍රවාහන මාධ්‍යය, ගුරු වෘත්තීය තුළ ඉදිරියට පැමිණෙන රැකියා අවස්ථා, පන්ති කාමර පහසුකම් ආදී ස්වාධීන විචල්‍යයන් අතර දුබල ඍණ සහසම්බන්ධතාවයක් හඳුනා ගෙන ඇත.

### ආශ්‍රිත ග්‍රන්ථ

Choy, S.P., Bobbitt, S.A., Henke, R.R., Medrich, E.A., Horn, L.J., & Lieberman, J. (1993). America's teachers: Profile of a profession. (NCES 93-025). Washington, DC: U.S. Department of Education, National Center for Education Statistics.

Dinham, S. & Scott, C. (2000), "*Teachers' work and the growing influence of societal expectations and pressures*", paper

presented at the American Educational Research Association Annual Meeting, April, New Orleans, LA.

Ministry of Education. (2020). *Annual School Census of Sri Lanka Final Report - 2020*. Retrieved on 25th August, 2022, from 151. http://www.statistics.gov.lk/Education/StaticalInformation/SchoolCensus/2020%0Ahttp://www.statistics.gov.lk/Resource/en/Education/School_Census/School_Census_Report_2019.pdf